කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **02** WW/O/22/10/01/02

වර්ණය : රතු

# තද සුළං සහ රළු මුහුද පිළිබඳව අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය.**

වලංගු කාලය - 2022 ඔක්තෝම්බර් 01 ප.ව. 02.00 සිට ඔක්තෝම්බර් 02 ප.ව. 02.00 දක්වා
2022 ඔක්තෝම්බර් 01 ප.ව. 02.00 ට නිකුත් කරන ලදි.

## ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශය සඳහා

## සැලකිලිමත් වන්න!

ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශයේ සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (60-70)** දක්වා වැඩි විය හැකි අතර **මුහුදු රළ උස මීටර් (2.5 - 3.0) ක් පමණ** ඉහළ යාමේ හැකියාවක් ද පවතී. එබැවින් එම මුහුදු ප්‍රදේශය ඉතා රළු වේ.

ගාල්ල සිට පුත්තලම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (50-60)** දක්වා වැඩි විය හැකි අතර මුහුදු රළ උස මීටර් **(2.0 - 2.5)** ක් **පමණ** ඉහළ යාමේ හැකියාවක් ද පවතී. එබැවින් එම මුහුදු ප්‍රදේශය රළු වේ.

**ඒ අනුව ඉදිරි පැය 24 ක කාලය තුල, ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතුවල නොයෙදන ලෙස දැනුම් දෙනු ලබන අතර ගාල්ල සිට කොළඹ හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල කටයුතු කරන ධීවර සහ නාවික ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරනමෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

